# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 1 දරන
# ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය
# ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
# පනත

---

[සහතිකය සටහන් කළේ 1966 ජනවාරි මස 09 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


1996 ජනවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : රු. 1.20 යි. තැපැල් ගාස්තු : රු. 2.55

# 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පනත

[සහතිකය සටහන් කළේ 1996 ජනවාරි මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 47/95

**ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

## 1 වන කොටස

### ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම

**ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම.**

2. (1) මේ පනතේ විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ කොමිෂන් සභාව (1) වන උප වගන්තියේ ඊට දෙනු ලැබූ නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයෝ.**

3. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් දෙදෙනෙක් ; එනම්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ—ජනරාල්වරයා ; සහ

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, එක් සාමාජිකයකු රජයේ නිලධරයකු විය යුතු, හතරකට නොඅඩු සහ හයකට නොවැඩි සාමාජික සංඛ්‍යාවක්.

(2) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කළ යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ ධුර කාලය සහ කොමිෂන් සභාවේ සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සම්බන්ධයෙන් ද කොමිෂන් සභාවේ රැස්වීම් සහ මුද්‍රාව සම්බන්ධයෙන් ද මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලපැවැත් විය යුතු ය.

## II වන කොටස

### කර්තව්‍ය සහ බලතල

කොමිෂන් සභාවේ කර්තව්‍ය.

4. පහත දැක්වෙන අරමුණු ඇතිව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය පිළිබඳව රජයට උපදෙස් දීම සහ සහායවීම කොමිෂන් සභාවේ කර්තව්‍ය විය යුතු ය :—

(අ) රටේ ආර්ථික සංවර්ධනය නංවාලීම සහ කඩිනම් කිරීම ;

(ආ) ආර්ථිකයේ කාර්යක්ෂමතාව සහ තරගකාරීත්වය වැඩිදියුණු කිරීම ;

(ඇ) නව තාක්ෂණය සහ විශේෂඥ දැනුම අත්කරගැනීමෙන් තරගකාරීත්ව පදනමක් මත අන්තර් ජාතික වෙළෙඳ පොළ වලට ප්‍රවේශය සහිතව නිෂ්පාදනය සහ සේවා උසස් තත්ත්වයකට පත් කිරීම ;

(ඈ) ප්‍රාග්ධන වෙළෙඳ පොළ දියුණු කිරීම හා පුළුල් කිරීම සහ දීර්ඝ කාලීන පුද්ගලික ඉතිරි කිරීම් සංචලනය කිරීම ;

(ඉ) පෞද්ගලික අංශයේ උනන්දුව ඇති කිරීම ;

(ඊ) සමාජ කටයුතු වඩා හොඳින් ඉටු කළ හැකි වීම සඳහා රජයේ ආදායම වර්ධනය කිරීම.

ලතල
ා කාර්ය.

5. කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය :—

(අ) ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය රාජ්‍ය ව්‍යවසාය නිශ්චය කර තීරණය කිරීම සඳහා සමීක්ෂණ සහ අධ්‍යයන පැවැත් වීම

(ආ) පවත්වාගෙන යා හැකි සහ ස්ථායි රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන උපක්‍රමයක් සඳහා රාමු සැකිල්ලක් සකස් කිරීම ;

(ඇ) ලාභ උපදවන්නා වූ ද ජාතික වැදගත්කමක් ඇත්තා වූ ද රාජ්‍ය ව්‍යවසායන් අවිච්ඡින්නව පවත්වාගෙන යාම සහ ඒවායේ කාර්යක්ෂමතාව ගැන රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඈ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය තෝරා ගැනීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඉ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්වල කොටස් හෝ වත්කම් මහජනයාට විකිණීම හෝ බැහැර කිරීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඊ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද කොටස් සියල්ලම භාණ්ඩාගාරයේ ලේකම්වරයාට අයිති වූ ද සමාගම් රජය වෙනුවෙන් කළමනාකරණය කිරීම ;

(උ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද කොටස් බහුතරයක් රජය හැර වෙනත් තැනැත්තන් විසින් දරනු ලබන්නා වූ ද සමාගම්වල කාර්ය සාධනය සෝදිසි කිරීම හා ඒවායේ කාර්ය සාධනයෙහි දුර්වලතා හඳුනාගැනීම සහ මේ දුර්වලතා නිවැරදි කිරීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඌ) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් විධිමත් කිරීමේ දී රජයට උපදෙස් දීම සහ සහාය වීම ;

(එ) රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සඳහා වූ රජයේ ප්‍රතිපත්ති සහ වැඩ සටහන්වලට කැපවීමේ හැඟීමක් මහජනයා තුළ දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් පිළිබඳ මහජනයා තුළ දැනුවත් බව ඇති කිරීමට රජයට සහාය වීම ;

(ඒ) ඒ ප්‍රතිපත්ති සහ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ (ඉ) ඡේදයේ සඳහන් සමාගම්වල කොටස් අයිතියෙහි ලද සේවක සහභාගිත්වය තහවුරු කිරීම ;

(ඔ) කොමිෂන් සභාවේ කටයුතු කළමනාකරණය සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඕ) එහි කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමට අවශ්‍ය යයි සැලකෙන ගිවිසුම්වලට එළඹීම ;

(ක) කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමට අවශ්‍ය නිලධරයන්, සේවක යන් හෝ අනුයෝජිතයන් පත් කිරීම, ඔවුන් සේවයේ නියුක්ත කරවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ග) සේවා පිරිස් හුවමාරු කිරීම, උපදේශක සේවා සහ සේවා පිරිස් පුහුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ හෝ විදේශවල අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමඟ සුසංයෝගිතාව සඳහා ගිවිසුම්වලට එළඹීම ;

(ච) යම් බැංකුවක හෝ බැංකුවල, ජංගම, ඉතිරි කිරීම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම;

(ජ) කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ සුබ සිද්ධිය සඳහා අර්ථ සාධක අරමුදල් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ඇති කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම;

(ට) එහි කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ණයට ගැනීම;

(ඩ) එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ දක්ෂතා වර්ධනයට අවශ්‍ය විය හැකි ක්‍රියා මාර්ග ගැනීම;

(ණ) ප්‍රකාශන, චක්‍රලේඛ සහ පුවත්පත් දැන්වීම් නිකුත් කිරීම;

(ත) තත් කාර්ය සඳහා බලය ලැබී ඇත් නම්, රජයේ අනුයෝජිතයා වශයෙන් යම් කාරණයක හෝ ගනුදෙනුවක කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශවල කටයුතු කිරීම;

(ද) කොමිෂන් සභාවේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පහසු කිරීම සඳහා කොමිෂන් සභාවේ මතය පරිදි අවශ්‍ය සියලු කටයුතු භාර ගැනීම.

## III වන කොටස

## මුදල්

කොමිෂන් සභාවේ අරමුදල

6. (1) කොමිෂන් සභාවට, කොමිෂන් සභාවේ අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේදී, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව ලබන්නා වූ සියලු මුදල්;

(ඇ) දේශීය හෝ විදේශීය කවර වූ හෝ ප්‍රභවයකින් තෑගි, ප්‍රදාන, දීමනා, ණය, තෙස්තමේන්තු දායාද වශයෙන් කොමිෂන් සභාව ලබන්නා වූ සියලු මුදල්;

(ඈ) කොමිෂන් සභාව විසින් ණයට ගන්නා සියලු මුදල් කොමිෂන් සභාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

7. කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය.

8. (1) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තැබීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය. ගිණුම් විගණනය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

9. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ උපදේශය මත (මෙහි මින්මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික හා අනිකුත් ප්‍රතිලාභ ඔහුට ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවට වගකිව යුතු ය. උපදේශක තත්ත්වයකින් කොමිෂන් සභාවේ රැස්වීම්වලට සහභාගී වීමට ඔහුට හිමිකම තිබිය යුතු ය. නමුත් එම රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකම නොතිබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරනු ලබන බලතල, කර්තව්‍ය හා කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

10. (1) කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන්, සේවකයන් සහ උපදේශකයන් කොමිෂන් සභාව විසින් පත් කළ හැකි අතර, එසේ පත් කරන ලද නිලධරයන්ට, සේවකයන්ට සහ උපදේශකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ද ඔවුන්ගේ සේවා කොන්දේසි ද කොමිෂන් සභාව විසින් නිශ්චය කළ යුතු ය. නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(2) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක 1994

අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(5) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින්, ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළැඹුණු යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා කොමිෂන් සභාවට සේවය කරන යම් සේවා කාලයක් ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීම සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය ආයතනවල නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

11. (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වනු ලබන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් සහ කොන්දේසි ඇතුළු, නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උප වගන්තිය යටතේ තාවකාලිකව හෝ ස්ථිරව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබූ අවස්ථාවක ඔහු කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

වාර්තා සහ තොරතුරු

12. (1) මේ පනතේ 5 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය අතුරින් යමක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකිවීම සඳහා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් තම කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තකු විසින් ලිඛිත දැන්වීමක් මගින්, යම් තැනැත්තකුට, යම් රාජ්‍ය ව්‍යවසායක ව්‍යාපාරික කටයුත්තක් හෝ ගනුදෙනුවක් පිළිබඳව එම තැනැත්තා දන්නා හෝ එම තැනැත්තාගේ සන්තකයෙහි ඇත්තා වූ සහ එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් වාර්තා හෝ තොරතුරු එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය ඇතුළත කොමිෂන් සභාවට හෝ බලය දෙන ලද තැනැත්තාට හෝ සපයන ලෙස නියම කළ හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීමට නියමිත යම් තැනැත්තකු, ඒ වාර්තාව සැපයීමෙන් හෝ ඒ තොරතුරු හෙළි

කිරීමෙන් යම් නීතියක විධි විධාන යටතේ වළක්වනු ලැබ ඇත්නම් මිස, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම, ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) අධිකරණයක් විසින් නියම කරනු ලැබුවහොත් හෝ කොමිෂන් සභාවේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා හැර, කොමිෂන් සභාව විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ කොමිෂන් සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් (1) වන උපවගන්තිය යටතේ සපයන ලද යම් වාර්තා හෝ තොරතුරු යම් තැනැත්තකුට හෙළි කිරීම හෝ භාවිත කිරීම නොකළ යුතු ය.

13. කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ සේවා නියුක්තයින් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

14. අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් විශයෙන් සලකනු ලැබිය යුතු අතර, එපරිද්දෙන් ඒ පනතේ විධි විධාන තේරුම් ගත යුතු ය. අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාවේ උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

15. කොමිෂන් සභාවේ වැඩ කටයුතු පිළිබඳ අවශ්‍ය වන වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු අවශ්‍ය ආකෘතියකින් තමාට සපයන ලෙස ජනාධිපතිවරයා විසින් කලින් කල කොමිෂන් සභාවට විධාන කළ හැකි අතර කොමිෂන් සභාව විසින් එවැනි සෑම විධානයක්ම ඉටු කළ යුතු ය. ජනාධිපතිවරයාට තොරතුරු ආදිය සැපයීම.

16. (1) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(2) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදම් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන යම් ගාස්තු කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සද්භාවයෙන් කරනු ලැබුවේ යම් අධිකරණයක් අදහස් කරන්නේ නම් ඒ ක්‍රියාව සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් සිවිල් හෝ අපරාධ නඩුවේදී ඔහු විසින් අය කර ගත නොමැති නම්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

වැරදි.

17. (1) (අ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව යම් වාර්තා හෝ තොරතුරු සැපයීම පැහැර හරින ;

(ආ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන ;

(ඇ) 12 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් තමා වෙත පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව තමා විසින් සපයනු ලබන යම් වාර්තාවක හෝ තොරතුරක යම් කාරණයක් උවමනාවෙන්ම සඳහන් නොකර හරින ;

(ඈ) 12 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධි විධාන උල්ලංඝනය කරන ;

(ඉ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ සේවකයකුට උවමනාවෙන්ම බාධා කරන

යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) මේ පනතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකුම ද,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු

ඒ වරදට වරදකරුවකු ලෙස සැලකිය යුතු ය :

එසේ වුවද, ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ ඒ වරද වැළැක්වීමට තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ විසින් නැතහොත් ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

18. (1) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය සටහට කොමිෂන් සභාව ඇතුළත් කිරීමේ සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය. දේශීය බදු නිදහස් වීම.

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 9 වන වගන්තිය සටහට කොමිෂන් සභාව ඇතුළත් කිරීමේ සිට සහ ඉන් පසුව, කොමිෂන් සභාවේ සෑම නිලධරයකුගේ, සේවකයකුගේ සහ උපදේශකයකුගේ පඩිනඩි ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(3) කොමිෂන් සභාවට මුදලින් හෝ වෙනත් ආකාරයකින් දෙන ලද පරිත්‍යාගයක්, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ වෙනත් ආකාරයකින් දෙන ලද පරිත්‍යාගයක් වශයෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

19. කොමිෂන් සභාව විසින්, 5 වන වගන්තියේ (ඉ) ඡේදය යටතේ කරන ලද නිර්දේශය අනුව, අවස්ථාවෝචිත පරිදි, එක් එක් විකිණීම අවසානයේදී හෝ බැහැර දීම මගින් හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම අවසානයේ දී ඒ විකිණීමට හෝ බැහැර කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් වූ වාර්තාවක් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්තා.

20. ජනාධිපතිවරයා විසින් පත් කරන ලද විශේෂ කාර්ය සාධක බලකාය විසින් 1995 මාර්තු මස 1 වන දිනයෙන් ආරම්භව නියමිත දිනයෙන් අවසාන කාල පරිච්ඡේදය ඇතුළත රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය සඳහා කරන ලද ක්‍රියාවක් ඒ ක්‍රියාව කිරීමට ඒ කාර්ය සාධක බලකායට නීත්‍යානුකූලව බලය දී නොතිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය. වලංගු කිරීම.

21. (1) කොමිෂන් සභාව වෙත පැවරුණු, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ දී කර්තව්‍ය සහ කාර්ය ඉටුකිරීම සම්බන්ධයෙන් රීති සෑදීමට මේ පනතින් බලය ලැබී ඇති කරුණු සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව රීති සෑදිය හැකි ය. රීති සෑදීමට කොමිෂන් සභාවට ඇති බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට ක්‍රියාත්මක විය යුතු ය.

22. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සභාපති" යන්නෙන්, 3 වන වගන්තිය යටතේ නම් කරන ලද කොමිෂන් සභාවේ සභාපතිවරයා අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුලත් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"රාජ්‍ය ව්‍යවසාය" යන්නට සංස්ථාවක් හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනයක් හෝ සියලුම කොටස් හෝ කොටස්වලින් බහුතරය හෝ රජය විසින් දරනු ලබන සමාගමක් ඇතුලත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ.

[3 වන වගන්තිය]

## උපලේඛනය

### කොමිෂන් සභාවේ සාමාජිකයන්ට අදාළ විධි විධාන

1. යම් තැනැත්තකු —

(අ) තමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වතකු හෝ වස්තු භංගත්වයට පත්වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ නිදහස් නොකළ බුන්වතකු හෝ වස්තු භංගත්වයට පත්වූවකු වේ නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයක් විඳින හෝ විඳ ඇත්නම්,

ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස දිගට ම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

2. කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු විසින්, තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයාට යොමු කරන ලිපියක් මගින් කොමිෂන් සභාවෙන් ඉල්ලා අස් විය හැකි ය.

3. අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා කොමිෂන් සභාවේ යම් පත් කළ සාමාජිකයකු ඉවත් කළ හැකි ය.

4. (1) නිල බලයෙන් පත්වන සාමාජිකයා, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරව ද ඒ ධුරය දරන තාක් කල් සාමාජිකයකු වශයෙන් ධුරය දැරිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සෑම පත් කළ සාමාජිකයකුම මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හැරියහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද, මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා හෝ අන්‍යාකාරයකින් ස්වකීය ධුරය අත් හරින සාමාජිකයකු වෙනුවට පත්කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයකු, කලින් ධුරය අත්හැරියහොත් මිස, තමා අනු ප්‍රාප්තිකයා වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවූ කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(3) රෝගාතුරවීම, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයෙහි කටයුතු කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට තාවකාලික ව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු හෝ අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ කොමිෂන් සභාවේ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

5. සභාපතිවරයාට සහ සාමාජිකයන්ට අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පාරිශ්‍රමිකයන් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

6. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ධුර කාලය කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්වයේ කාල පරිච්ඡේදය විය යුතු ය.

(2) සභාපතිවරයා විසින් තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති වශයෙන් වූ තම ධුරයෙන් කලින් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක, හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසාන කළ හැකි ය.

7. (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා ගත් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(2) පනතින් කොමිෂන් සභාවට පැවරී, නියමකර හෝ වෙන්කර දී ඇති යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමිෂන් සභාව විසින් සභාපතිවරයාට පැවරිය හැකි ය.

(3) අවම වශයෙන් සෑම ලිත් මාස හයකට වරක් කොමිෂන් සභාව රැස්විය යුතු ය.

(4) රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන්දෙනෙක් විය යුතු ය.

(5) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සහ එවැනි රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳව කාර්ය පරිපාටිය විධිමත් කෙරෙන රීති සෑදිය යුතු ය.

8. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර, නොකළ යුතු ය.

(4) කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් කොමිෂන් සභාව විසින් තබාගත යුතු ය.

9. කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය තිබිය යුතු අතර එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් ම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස නොසැලකිය යුතු ය.